**ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම - 2022/ 2023**

**-------------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගමේ ("සමාගම") 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ අලාභ, හා අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2023 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (SLFRS for SMEs) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සුළු හා මධ්‍ය පරිමාණ අස්ථිත්‍ය සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතියේ 17.19 වගන්තිය ප්‍රකාරව 2023 මාර්තු 31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වී ඇති නමුත් තවමත් භාවිතයේ පවතින රු.693,993,216 ක් වටිනා වත්කම්වල ඵලදායී ආයු කාලය නැවත තක්සේරු කර ඒ අනුව වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශයේ සංවර්ධන සහ නවෝත්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන දැනටමත් රසායනාගාර උපකරණ නැවත ඇගයීම ආරම්භ කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල විය යුතුය. |

**1.5.2 සමාගමේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනයෙහි සමාගමේ අඛණ්ඩ පැවැත්ම සම්බන්ධ 2.6 සටහන වෙත අවධානය යොමු කරමි. සමාගම සමාලෝචිත වර්ෂය සඳහා රු.53,324,398 ක ශුද්ධ අලාභයක් හා සමාලෝචිත වර්ෂය අවසානයේ දී රු.1,422,311,947 ක සමුච්චිත අලාභයක් ලබා ඇති අතර ඒ අනුව සමාගමේ මුළු වත්කම් රු.59,802,470 ක් ඉක්මවූ මුළු වගකීම් පවතී. | මේ සඳහා විශේෂ මහා සභා රැස්වීමේදී (EGM) අවධානය යොමු කර ඇත. | සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ දැඩි අවධානය යොමු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වසර හතරක් ඉක්ම වූ රු.2,767,407 ක් ද, වසර එකක් ඉක්මවූ වූ රු.6,503,883 ක් ද වූ ණයගැති ශේෂවල මුළු එකතුව රු.9,271,290 ක් වූ අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂය තුළ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම ශේෂයන් අයකර ගැනීමට කළමනාකාරිත්වය ඔවුන්ගේ උපරිමයෙන් උත්සාහ කර ඇත. කෙසේ වෙතත්, විවිධ හේතු නිසා එය අසාර්ථක විය. | ලැබිය යුතු මුදල් අයකර ගත යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පර්යේෂණ ව්‍යාපෘති හතරක කටයුතු අවසන් කර වසර දෙකකට වැඩි කාලයක් ගතවී ඇතත්, ඉතිරි මුදල වූ රු.1,908,230 ක වටිනාකම පියවීමට කටයුතු කර නොතිබුණි. | එකඟ වෙමි. මෙම වසරේ දී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමින් පවතී. | ගෙවිය යුතු මුදල් පියවීමට ඉක්මන් පියවර ගත යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි 6.6 ඡේදය. | (i) මුදල් වර්ෂය අවසන් වී දින හැටක් (60) ඇතුළත ගිණුම් වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු නමුත්, 2023 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ගිණුම් වාර්තා ඉදිරිපත් කර තිබුණේ මාස 02 කුත් දින 24 කට පසුව එනම් 2023 අගෝස්තු 24 දින දීය. | මූලික වශයෙන් ප්‍රමාදය සිදු වූයේ මෑත කාලීන කළමනාකාරීත්වයේ වෙනස් වීමත්, මූල්‍ය කාර්ය මණ්ඩල අඩු වීමත් වාර්ෂික විගණන ක්‍රියාවලිය කාලානුරූපීව ආරම්භ කිරීමට බලපා ඇත. | රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ මෙහෙයුම් මාර්ගෝපදේශ අත්පොතෙහි සඳහන් කර ඇති කාල රාමුවට අනුව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත භාර දිය යුතුය. |
| | (ii) මූල්‍ය වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් සමඟ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතු වුවත් සමාගම විසින් වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | -එම- | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 22,431,598 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.4,875,832 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.17,555,766 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂයේ පරිපාලන වියදම් රු.23,189,427 කින් ඉහළ යාමත්, රජයේ ප්‍රදාන රු.38,400,000 කින් පහළ යාමත්, ඉංජිනේරු සේවා ආදායම රු.16,555,643 කින් පහළ යාමත්, කුළී ආදායම රු.52,217,611 කින් ඉහළ යාමත්, විශ්ලේෂණ සේවා ආදායම රු. 6,088,642 කින් ඉහළ යාමත් පර්යේෂණ හා සංවර්ධන වියදම රු.2,452,289 කින් පහළ යාමත් ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වටිනාකම රු.1,412,601 ක් වූ නිමි පොහොර තොගයක් ගිණුම් වර්ෂය අවසාන දිනය වන විටත් ගබඩාව තුළ නොවිකිණී පැවතුණි. | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් 2009 වර්ෂයේදී කෘෂිකර්මාන්තයේ යූරියා නාස්තිය අවම කිරීමේ අරමුණින් හයිඩ්‍රොක්සිඇපටයිට් නැනෝ අංශු උපයෝගී කරගනිමින් යූරියා මත පදනම් වූ සෙමින් නිදහස් කරන පොහොරක් නිෂ්පාදනය ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකාවේ දේශීය යූරියා නිෂ්පාදන කම්හලක් නොමැතිකම හේතුවෙන් දේශීය හා ජාත්‍යන්තර සංවිධානවල උනන්දුව ආකර්ෂණය කර ගනිමින් මෙම පර්යේෂණය සැලකිය යුතු ආකර්ෂණයක් ලබා ගනු ලැබිණි. 2017 වන විට, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් කුඩා පරිමාණ යූරියා-හයිඩ්‍රොක්සිඇපටයිට් නැනෝ දෙමුහුන් නිෂ්පාදන කම්හලක් ස්ථාපිත කරන ලදී. කෙසේ වෙතත්, අඛණ්ඩව පවත්වා ගෙන යාමට අවශ්‍ය සහයෝගය සීමිතවීම හේතුවෙන්, නිෂ්පාදනය තාවකාලිකව අත්හිටුවන ලදී. | නව නිපැයුම සඳහා සුදුසු වෙළෙඳපොළක් නිර්මාණය කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් 2021 නොවැම්බර් 15 වන දින, පෞද්ගලික සමාගමක් සමඟ වසර පහක කාලසීමාවක් සඳහා කාර්යාල සහ රසායනාගාර ඉඩ පහසුකම් ලබා දීමට බදු ගිවිසුමකට එළැඹ තිබුණු අතර ගිවිසුමේ කොන්දේසිවලින් පරිබාහිරව රු.1,986,673 ක් වටිනා ලී බඩු බදු දුන් කාර්යාල පරිශ්‍රය සඳහා ලබා දී තිබුණි. | අපගේ නව ගාස්තුව ආකර්ෂණය කර ගැනීම සඳහා, ජෝන් කීල්ස් හෝල්ඩින් පීල්සී වෙත එවැනි සහයෝගයක් ලබා දුන් නමුත් ඒ සඳහා භාණ්ඩාගාර අරමුදල් භාවිතා නොකළේය. | ගිවිසුමට අනුකූල විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නැනෝ පොහොර සංවර්ධන තාක්ෂණය පැවරීම සඳහා ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් 2012 මාර්තු 15 වැනි දින ඉන්දියානු සමාගමක් සමඟ ගිවිසුමකට එළැඹ ඇත. ගිවිසුමට අනුව සම්පූර්ණ වටිනාකම ඇමෙරිකානු ඩොලර් 2,250,000 ක් වූ අතර වාරික හතරකින් ආපසු අයකර ගැනීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ගිවිසුමට අනුව ඇමරිකානු ඩොලර් 1,000,000 ක මුදලක් පමණක් නියමිත වේලාවට නිරවුල් කර ඇති අතර, 2013 ජූනි 30 වන දින ඇමරිකානු ඩොලර් 750,000 ක මුදලකට ඉන්වොයිසියක් නිකුත් කර තිබුණද, එය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආපසු අය කර ගෙන නොතිබුණි. | පෝෂක ද්‍රව්‍ය සෙමෙන් නිදහස් කරන පොහොර අයිතිය නාගර්ජුන මිලදී ගෙන ඇමරිකානු ඩොලර් මිලියන 1.0 ක් ගෙවන ලදී. ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් පේටන්ට් බලපත්‍රය මාරු කිරීමත් සමඟ ඔවුන් දෙවන වාරිකය ගෙවීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, මූල්‍ය අභියෝග හේතුවෙන් සේවාදායකයාට ගෙවිය යුතු මුදල් පියවීමට නොහැකි විය. තවද අප විසින් අපගේ නමින් ඇති පේටන්ට් බලපත්‍රය නිකුත් කර නොමැති අතර ඉතිරි මුදල නොලැබුනහොත් අපගේ පේටන්ට් බලපත්‍රයෙන් ඉදිරියේදී මුදල් ඉපැයීමට කටයුතු කරන බවට සඳහන් කරමින් ලිපියක් ද සේවාදායකයා වෙත නිකුත් කර ඇත. | ලැබිය යුතු ආදායම එකතු කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් නේවාසිකාගාර පහසුකම් සැපයීම සඳහා ගොඩනැගිලි 2 ක් තුළ කාමර 62ක් ඉදිකර ඇති අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | කුලියට ලබා දීම සඳහා විවිධ පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරමින් පවතින අතර වැඩිදුරටත් අවශ්‍ය පහසුකම් සකස් කරමින් පවතී. | භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ආ) | 2017 වසරේදී රු.33,373,109 ක වියදමින් හරිත නිවසක් ඉදිකර තිබුණද, 2023 සැප්තැම්බර් වන විටත් එය අපේක්ෂිත කාර්යය සඳහා යොදා ගෙන නොතිබුණි. | ග්‍රීන් හවුස් පහසුකම පාරිභෝගිකයන් කිහිප දෙනෙකුට වරින් වර ප්‍රයෝජනයට ගැනීමට ලබා දී ඇති අතර ව්‍යාපාර කටයුතුවල නියැලී සිටින ගනුදෙනුකරුවන් ස්වල්ප දෙනෙක් පහත පරිදි වේ.<br>• කෝජෙන්(Codgen)<br>• LOLC උසස් තාක්ෂණයන් | භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |
| (ඇ) | 2017 වර්ෂයේ සිට සක්‍රීය ඖෂධීය අමුද්‍රව්‍ය නියමු බලාගාර උපාය මාර්ගික ව්‍යාපෘතිය සඳහා මිලදී ගත් රු.88,770,040 ක රසායනාගාර උපකරණ සහ ගෘහභාණ්ඩ 2023 මාර්තු මාසය අවසන් වන විටත් එකී කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | සාර්ථකත්වයත් සමඟ, ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ (පුද්) සමාගම විසින් රසායනාගාර පරිමාණ පරීක්ෂාව සම්පූර්ණ කර, අවශ්‍ය කිලෝ පරිමාණයන් ලබා ගෙන, විශ්ලේෂණ සහතිකය ලබා ගෙන ඇත. දැනට, මෙම ව්‍යාපෘතිය අත්හැර දමා ඇති අතර, මෙම උපකරණවලින් සමහරක් වෙනත් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඛනිජ රසායනාගාර සහ ස්වභාවික නිෂ්පාදන රසායනාගාර සඳහා භාවිතා කරනු ලැබේ. | භාවිතා කළ හැකි වත්කම් ප්‍රයෝජනයට ගත යුතුය. |